# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,878 – 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා – 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අගෝස්තු මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | හික්කඩුව | ගාල්ල දිස්ත්‍රික්කයේ මාදම්පේ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැල්ලබඩපත්තුව කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| ගාල්ල | නාගොඩ | ගාල්ල දිස්ත්‍රික්කයේ මාපලගම ඇතුමලේ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා ගඟබඩ පත්තුව කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-899

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු —කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අගෝස්තු මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | ගල්ගමුව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුව කොට්ඨාසයේ වල්පාලුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

08-898

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අගෝස්තු මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතලේ | උකුවෙල | මාතලේ දකුණ කොට්ඨාසයේ වරකාමුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

08-890

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අගෝස්තු මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | ඌවපරණගම | ගම්පහ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

08-889

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 සැප්තැම්බර් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අගෝස්තු මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපළාත | ලැගුන්දෙනිය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උඩපළාත විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

08-888

---

**පුරප්පාඩු**

ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පහත සඳහන් තනතුරු සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. දිස්ත්‍රික් අධ්‍යක්‍ෂ තනතුර - තනතුරු 01 යි.
කළුතර දිස්ත්‍රික්කය

02. පළාත් අධ්‍යක්‍ෂ තනතුර - තනතුරු 01 යි.
උතුරු පළාත

(i) දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරක සේවය කර විශ්‍රාම ගිය වයස අවුරුදු 67 නොඉක්මවූ නිලධාරියෙකු විය යුතු අතර වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

(ii) සම්බන්ධීකරණ හා විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

(iii) තෝරාගනු ලබන නිලධාරින් සඳහා සියළු දීමනා ඇතුලත්ව රු. 25,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

තම ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පතක් 2014.09.30 දින හෝ ඊට පෙර ලේකම් ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැගිල්ල, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

ටී. එම්. කේ. බී. තෙන්නකොන්,
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

08-984

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

නීති නිලධාරි (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

***ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව***

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයඳුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්‍ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :-*

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) *කායික සුදුසුකම් :*
සෑම අපේක්‍ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනයට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි I වැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරික්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ කාර්ය පටිපාටික රීති හා ආයතනය සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව :-*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි එස්එල් - 1 - 2006 වැටුප් බාණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා පහත සඳහන් ලකුණු දීමේ පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | 20 |
| පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| සටහන.-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත්වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි.<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | 15 |
| පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍ර පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. **අතිරේක පළපුරුද්ද :** | | 30 |
| නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| 04. **පරිගණක සාක්‍ෂරතාව :** | | 15 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්‍ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| රජයේ පිළිගත් ආයතනයක මාස 06කට නොඅඩු තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| රජයේ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| 05. **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :** | | 15 |
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය) | 15 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| 06. **සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන ලද කුසලතාව :** | | 05 |
| **මුළු ලකුණු :** | | 100 |

07. *අපේක්‍ෂකයන්ගේ අනන්‍යතාවය :*
ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්‍ෂකයන් පමණි. සම්මුඛ පරීක්‍ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
සම්මුඛ පරීක්‍ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(අ) අයදුම්පත් 2014.09.25 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තෙහි සකස්කර මුල්පිටුව අංක 01 සිට 14 දක්වාත් දෙවැනි පිටුවෙහි ඉතිරිය ද වන ආකාරයෙන් පිළියෙල කළ යුතුය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර " යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ගාමිණී ඉලංගරත්න,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

***ආදර්ශ අයදුම් පත්‍රය***

*ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය*

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසී කැපිටල් අකුරෙන්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. දුරකථන අංකය :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.

07. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
වර්ෂ :———. මාස :———. දින :———.

08. ජාතිය :————.

09. විවාහක/අවිවාහක බව :————.

10. නීති උපාධිය පිළිබඳ විස්තර :
විශ්ව විද්‍යාලය :————.
උපාධිය පිරිනැමු දිනය :————.
භාෂා මාධ්‍ය :————.

11. නීතඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

12. නීතිඥයෙකු ලෙස වෘත්තීය පළපුරුද්ද : වසර ගණන :————.

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

14. භාෂා ප්‍රවීණතාව : (අදාළ තීරුවේ හරි (    ) ලකුණ යොදන්න.)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

15. *අයදුම්කරුගේ සහතිකය :*

.........................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්‍ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයකුසේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙලිවුවහොත් නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

මෙහි අත්සන් කරන ලද ......................... හි පදිංචි .............. මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ......... දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

17. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.................................... මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් සේවයේ නියුතු බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාව)

08-1076

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

**මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා පාඨමාලා - 2014**

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.**

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම**

**Computer Typesetting and Layout Design**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

**කාලය : මාස 5යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,850**

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික්ස් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබාදෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයින්ට මනා දැනුමද පුහුණුවද ලබා දේ.

**කාලය - මාස 4යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු - රු. 15,350** NVQ **පාඨමාලාව රු. 26,000**

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලව පාසැල් හැරගිය නවකයින්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයින්ටද Ms Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

**කාලය : මාස 4යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 10,850**

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයින්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයින්ටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**කාලය - මාස 4යි (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු - රු. 15,350**

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබා දේ. පාසැල් හැරගිය සිසුන්ටද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**කාලය - මාස 04 - (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. - 20,850**

**ත්‍රිමාණ සජීවිකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරනය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

**කාලය - මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 20,850**

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින්ට ද මහත් ප්‍රයෝජනයක් වනු ඇත.

**කාලය - මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල ගාස්තුව - ආයතනික පාඨමාලාව රු. 15,850**

NVQ **පාඨමාලාව රු. 26,000**

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන** NVQ **පාඨමාලව - NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

**කාලය - මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය - සිංහල පාඨමාලා ගාස්තුව - රු. 20,850**

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

**පාඨමාලා කාලය - වසර 01 යි. (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 19,850**

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල්වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වනු ඇත.

**කාලය - වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 15,350**

**මුද්‍රණ පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය Costing and Estimating for Printers**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට හා එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව යෝග්‍ය වේ.

**කාලය - වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 15,350**

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබා දේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

**කාලය - වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 12,350**

නොමිලේ සම්මන්ත්‍රණයක්

ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා තාක්ෂණය පිළිබඳව සහ ඊට අදාල මෘදුකාංග (Software) භාවිතය පිළිබඳව නොමිලේ සහභාගිවිය හැකි සම්මන්ත්‍රණයක් අගෝස්තු 31 ඉරිදා පෙ. ව. 8.30 සිට සවස 2.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ දී පැවැත් වේ. ඉඩකඩ සීමිත නිසා 011 - 2686162 හෝ 011 - 2679791 දුරකථන අංක අමතා ආසනයක් වෙන් කරවා ගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියා වලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමාකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

ලේඛකාධිකාරි, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162, ඊමේල් : sliopreg@sltnet.lk
web : www.sliop.edu.lk

ශාඛා :-
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ.
දුරකථනය : 066 2222172
ජංගම : 071 0554298

08-941

---

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)**

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 දෙසැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය, උපලේඛනය - II හි දක්වා ඇති නගරවලදී පවත්වනු ලැබේ. එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර අයදුම්පත්‍රයේ විභාගයට පෙනී සිටින නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතුය.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 (අ) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුලත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.0 වැටුප.- අංක 06/2006(iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,990 - 10 x 145 - 11x170 - 6 x 240 - 14 x 320 - 23,230 වේ. රු. 15,440 න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 17,310 න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.0 සුදුසුකම්.—රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම දේශයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියළුම විෂයයන්ගෙන් එකවර සමත් ව තිබීම.

**සටහන** - විෂයය 04ක් සහිත වූ පැරණි විෂය නිර්දේශය යටතේ විෂයය 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

***සැ. යු.***-සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2014 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම.

දිස්ත්‍රික් නාම ලේඛනය, උපලේඛනය - 1 ලෙස දක්වා ඇත. පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛනය - 1 අනුව අයදුම්පත්‍රයේ නිවැරදිව සඳහන් කළ යුතුය.

(අ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.

(iii) විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

(ආ) *දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම්* - දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය.

එසේ නැතහොත්

(ii) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතුය.

එසේ නැතහොත්

(iii) ඔහු නොකඩවා අවුරුදු 05ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

සටහන - 1. ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

(i) උප්පැන්න සහතිකය,

(ii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය සහ අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාමලේඛන,

(iii) ශිෂ්‍ය කාර්ය දර්ශනය.

2. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්ය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රාජ්‍ය සේවයේ නිරත වන බැව් සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.)

3. කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

8.0 පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයෙකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතු ය.

9.0 *විභාග පරිපාටිය* :-

(අ) විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

*භාෂා හැකියාව.*—මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*අභියෝග්‍යතාව.*—මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන* :

I. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

II. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචන වල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ආ) මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඇ) *විභාග ප්‍රතිඵල* - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් තැපෑලෙන් හෝ www. results.exams. gov.lk වෙබ් අඩවිය මගින් සිදුකෙරෙනු ඇත.

10.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*—ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0 *විභාග ගාස්තු.*—විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

12.0 *අයදුම්පත්‍ර.*—ඒ 4(සෙ. මි. 21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,—

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ඈ) අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගටම යෙදෙන කොටස පළමුව ලියා, පෙළපත් නාමයට අදාළ නම්වල මුලකුරු හා නමෙහි අනෙකුත් කොටස්වල මුලකුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

උදා :- අයදුම්පත්‍රයේ 1.2 අනුව සම්පූර්ණ නම - MATHURATA GAMARALALAGE BUDDHIKA SARATH KUMARA GUNAWARDHANA

අයදුම්පත්‍රයේ 1.1 හි - GUNAWARDHANA , M. G. B. S. K. ලෙස ලිවිය යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ

තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

සැ. යු.- 01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයන් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ. විභාගය පවත්වන නගර පිළිබඳ අවසාන තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු ය.

02. තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම්පත්‍රයේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතු ය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයන කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

12.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)" යන්න සහ ඔබ තරග කරන දිස්ත්‍රික්කය ද සඳහන් කරන්න.

12.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2014 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

13.0 *විභාගයට පෙනී සිටීම.*- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද හා ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගතයුතු අතර තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය. එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :—

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2014 ක් වූ අගෝස්තු මස 15 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2013 (2014)

Open Competitive Examination for Recruitment to Grade III of Public Management Assistants' Service - 2013 (2014)

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* *ගැසට් නිවේදනය* අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - II බලන්න)

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

* පුරප්පාඩු සඳහා තරග කිරීමට *ගැසට් නිවේදනයේ* 7.0 වැනි ඡේදයට අනුකූලව ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කය. (දිස්ත්‍රික්ක අංක සහිත උපලේඛනය - 1 බලන්න. අදාළ දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| | |

* ඔබ විභාගයට පෙනී සිටින්නේ *ගැසට් නිවේදනයේ* 8.0 ඡේදයේ ප්‍රකාරව, අබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ ද? (මෙම කොටසේ ''ඔව්" ලෙස සඳහන් කල යුත්තේ ආබාධිත අයදුම්කරුවන් පමණක් බැවින් පිරවීමට පෙර *ගැසට් නිවේදනයේ* 8.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි)

ඔව් - 1
නැත - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA M. G. B. S. K.
1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය

2.0 2.1 ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී -1 පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :
3.3 2014.09.29 දිනට වයස :
අවුරුදු : මාස : දින :
3.4 දුරකථන අංකය :

4.0 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :———.
4.2 උප දිසාපති/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———.
4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :———.

5.0 අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,
(i) විශ්ව විද්‍යාලය :———.
(ii) උපාධිය :———.
(iii) විභාග වර්ෂය :———.

6.0 වෙනත් සුදුසුකම් :———.

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ( √ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)
.......................... ඔව් නැත
..........................

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :———.
(ii) ලදුපත් අංකය හා දිනය :———.
(iii) ගෙවූ මුදල :———.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

9.0 *අයදුම්කරුගේ සහතිකය* :
(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි,
(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි,
(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

———,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :———.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*උපලේඛනය - I*

*දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක*

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වව්නියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

*උපලේඛනය - II*

*විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරයන්*

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 01 කොළඹ | කොටහේන | 01 |
| | මරදාන | 02 |
| | බොරැල්ල | 03 |
| | කුරුඳුවත්ත | 04 |
| | බම්බලපිටිය | 05 |
| | හැව්ලොක් ටවුම | 06 |
| | නුගේගොඩ | 07 |
| | මොරටුව | 08 |
| | පිළියන්දල | 09 |
| | හෝමාගම | 10 |
| | මහරගම | 11 |
| | හංවැල්ල | 12 |
| | අවිස්සාවේල්ල | 13 |
| 02 ගම්පහ | මීගමුව | 14 |
| | මිනුවන්ගොඩ | 15 |
| | දිවුලපිටිය | 16 |
| | වේයන්ගොඩ | 17 |
| | ගම්පහ | 18 |
| | ජා-ඇල | 19 |
| | වත්තල | 20 |
| | කැළණිය | 21 |
| | දොම්පෙ | 22 |
| 03 කළුතර | හොරණ | 23 |
| | පානදුර | 24 |
| | කළුතර | 25 |
| | මතුගම | 26 |
| | අළුත්ගම | 27 |
| 04 මාතලේ | මාතලේ | 28 |
| | ගලේවෙල | 29 |
| | නාඋල | 30 |
| | ලග්ගල - පල්ලේගම | 31 |
| 05 මහනුවර | මහනුවර | 32 |
| | කටුගස්තොට | 33 |
| | තෙල්දෙණිය | 34 |
| | වත්තේගම | 35 |
| | නුගවෙල | 36 |
| | ගලගෙදර | 37 |
| | ගම්පොළ | 38 |
| 06 නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | නුවරඑළිය | 40 |
| | වතුමුල්ල | 41 |
| | හැටන් | 42 |
| | ගිනිගත්හේන | 43 |
| 07 ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | ගාල්ල | 45 |
| | බද්දේගම | 46 |
| 08 මාතර | වැලිගම | 47 |
| | මාතර | 48 |
| | කඹුරුපිටිය | 49 |
| | හක්මන | 50 |
| | දෙයියන්දර | 51 |
| | දික්වැල්ල | 52 |
| | අකුරැස්ස | 53 |
| | කොටපොල | 54 |
| 09 හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | වලස්මුල්ල | 56 |
| | වීරකැටිය | 57 |
| | තංගල්ල | 58 |
| | අම්බලන්තොට | 59 |
| | හම්බන්තොට | 60 |
| | තිස්සමහාරාමය | 61 |
| 10 යාපනය | චාවකච්චේරිය | 62 |
| | යාපනය | 63 |
| | තෙලිප්පල්ලෙයි | 64 |
| | පේද්‍රුරුතුඩුව | 65 |
| 11 මන්නාරම | මන්නාරම | 66 |
| | මුරුක්කන් | 67 |
| 12 මුලතිව් | මුලතිව් | 68 |
| 13 වවුනියා | වවුනියාව | 69 |
| 14 ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | ත්‍රිකුණාමලය | 71 |
| | මුතූර් | 72 |
| | පදවි පරාක්‍රමපුර | 73 |
| | කින්නියා | 74 |

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 15 | මඩකලපුව | මඩකලපුව | 75 |
| | | එරාවූර් | 76 |
| | | කාතන්කුඩි | 77 |
| 16 | අම්පාර | අම්පාර | 78 |
| | | සේරංකඩ | 79 |
| | | කල්මුණ | 80 |
| | | අක්කරපත්තු | 81 |
| | | සමන්තුරේ | 82 |
| 17 | පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | | මාදම්පේ | 84 |
| | | හලාවත | 85 |
| | | පුත්තලම | 86 |
| 18 | කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | | බිංගිරිය | 88 |
| | | නාරම්මල | 89 |
| | | පොල්ගහවෙල | 90 |
| | | කුරුණෑගල | 91 |
| | | ඉබ්බාගමුව | 92 |
| | | දොඩම්ගස්ලන්ද | 93 |
| | | මොරතිහ | 94 |
| | | නිකවැරටිය | 95 |
| | | මහව | 96 |
| 19. | අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | | කැකිරාව | 98 |
| | | අනුරාධපුරය | 99 |
| | | ගලෙන්බිඳුණුවැව | 100 |
| | | කහටගස්දිගිලිය | 101 |
| 20 | පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | | හිඟුරක්ගොඩ | 103 |
| 21 | බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | | වැලිමඩ | 105 |
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |
| 22 | මොණරාගල | බිබිල | 111 |
| | | මොණරාගල | 112 |
| | | වැල්ලවාය | 113 |
| 23 | කෑගල්ල | කෑගල්ල | 114 |
| | | රඹුක්කන | 115 |
| | | මාවනැල්ල | 116 |
| | | රුවන්වැල්ල | 117 |
| 24 | රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | | රත්නපුර | 119 |
| | | පැල්මඩුල්ල | 120 |
| | | බලංගොඩ | 121 |
| | | කලවාන | 122 |
| | | ඇඹිලිපිටිය | 123 |
| 25 | කිළිනොච්චි | කිළිනොච්චිය | 124 |
| | | පලෙයි | 125 |

08-1067

---

**රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2013 (2014)**

1.0 රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 දෙසැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 රාජ්‍ය සේවයට අයත් කණිෂ්ඨ සේවයකින් සඳහා මෙම විභාගය පහත සඳහන් නගර වලදී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| කොළඹ | 01 | ත්‍රිකුණාමලය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මාතලේ | 04 | පුත්තලම | 17 |
| මහනුවර | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | අනුරාධපුරය | 19 |
| ගාල්ල | 07 | පොළොන්නරුව | 20 |
| මාතර | 08 | බදුල්ල | 21 |
| හම්බන්තොට | 09 | මොණරාගල | 22 |
| යාපනය | 10 | කෑගල්ල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| මුලතිව් | 12 | කිළිනොච්චිය | 25 |
| වව්නියාව | 13 | | |

3.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. ඔහුගේ තීරණය අවසන් තීරණය වනු ඇත,

(ii) විභාග අපේක්ෂයන් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

4.0 අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතු භාෂා මාධ්‍ය :- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 *වැටුප*:—අංක 06/2006 (iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය : රු.13,990, 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - 23,230 වේ. රු.15.440 න් ඔබ්බට යාම සඳහා II වන පන්තියට උසස් වීමද රු. 17,310 න් ඔබ්බට යාම සඳහා I වන පන්තියට උසස් වීම ද ලබා ගත යුතුය.

***සටහන*** :- පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යෙදෙන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබා දෙනු ලැබේ.

6.0 ***සේවා කොන්දේසි*** :-

(i) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත,

(ii) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1840/34 සහ 2013.12.11 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේකෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.,

(iii) මෙම විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ,

(v) *රාජ්‍ය භාෂාව* :- රාජ්‍ය භාෂාවන් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියෙකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය,

*අනෙක් රාජ්‍ය භාෂාව* :- පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතුය.

7.0 *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම*.- රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවක සේවිකාවන් පමණක් තරඟ විභාගයට ඇතුළත් කරනු ලැබේ. විභාගයට අදාළ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයට හතලිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා පදනම මත තෝරාගනු ලැබේ. සටහන :- පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටිම සඳහා අවසර නොමැත.

8.0 *යෝග්‍යතාවය* :- මෙම විභාගය සඳහා තරඟ කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම,

(i) රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-01-2006 A වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය,

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය,

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක්වරකදී භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත්වී තිබිය යුතුය,

(iv) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය,

(v) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

***සටහන*** :-

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. ඉහත (ii) හි සඳහන් අවුරුදු 05 ක සතුටුදායක සේවය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයේ කාර්යයන් සඳහා සතුටුදායක සේවයේ ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේ සලකනු ලැබේ.

(i) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම,

(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වූ වර්ෂ 05 ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

3. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

4. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයන් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයින් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවුන ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු අතර එම දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා යම් සේවකයකුගේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විමසීමේදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව පූර්ව විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාල සීමාව ද සඳහන් කළ යුතුය.

5. රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයින්, මණ්ඩල සංස්ථා හා එවැනි අංශවල සේවකයින් මෙම විභාගයේ දී තරඟ කිරීමට සුදුස්සන් නොවනු ඇත.

6. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ කණිෂ්ඨ සේවකයින්ට හැර එම දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම කණිෂ්ඨ සේවකයෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.

7. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෑහීමට පත් විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේ දී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම ලැබීමට නුසුදුස්සෝ වෙති.

9.0 *අයදුම්පත්* :

(අ) (i) ඒ 4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්, අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. මෙම විභාගයට ඇතුළත් වීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනයට යා කර ඇත. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු වන අතර එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් බව ද අයදුම්පතේ ඡායා පිටපතක් හෝ ප්‍රගමණ පිටපතක් නොඑවන මෙන් ද දන්වා සිටිනු ලැබේ. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(iii) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම්පතේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතු ය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධයන් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

(ආ) විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂයට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇනවුම් හා මුද්දර බාරගනු නොලැබේ.

(ඇ) අයදුම්පත නිවැරදිව ද පැහැදිලිව ද අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත් අකුරින්ම සම්පූර්ණ කොට 2014.09.29 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

යන ලිපිනයට, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

10.0 අයදුම්පතේ අගට යොදා ඇති ආකාරයේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවකු/අයදුම්කාරියක මෙම ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. 2014.09.29 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

11.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනෙහි පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ඒ හා සමගම ඒ බැව් සඳහන් පුවත්පත් නිවේදනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත්වල පළකරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තරය සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම ද සුදුසුවේ. එසේ විමසීමේදී අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට යෝග්‍යතා පිළිගැනීමක් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම පසු අවස්ථාවක දී පිරීක්සා බැලීමට යටත් වන්නකි. විභාගයේ දී තරඟ කිරීමට නුසුදුස්සෙකු බව පසු අවස්ථාවක දී අනාවරණය වූ විභාග අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අපේක්ෂකත්වය විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයට පසු කවර අවස්ථාවක දී වුවද අවලංගු කරනු ලැබිය හැක.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරනු ඇත. මීට අමතරව විභාග අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල දැන්වීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.Results. Exams. gov.lk වෙබ් අඩවිය මඟින් සිදුකෙරෙනු ඇත.

14. *අයදුම්කරුගේ අනන්‍යතාවය*.—අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

16.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්*.— ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

17.0 *විභාග පරිපාටිය* :—

විභාග විෂය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| භාෂා හැකියාව හා කළමණාකරන සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 | පැය 02 1/2 |
| අභියෝග්‍යතාවය | 100 | 40 | පැය 01 |

භාෂා හැකියාව හා කළමණාකරන සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය : (කාලය පැය 02 1/2යි)

අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යකින්

ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමණාකරණ සහකාර නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියාකරන ආකාරය ආදී කළමනාකරණ සහකාර නිලධරයකුගේ රාජකාරි පිළිබඳව අපේක්ෂක/අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද,

කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල් ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න වලින් ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

I වන කොටස - භාෂා හැකියාව මැනෙන ආකාරයේ අවබෝධය හා සම්බන්ධ ව්‍යුහගත ප්‍රශ්න, සාරාංශ කොට ලිවීම සහ රචනය (පැය 1 විනාඩි 15 - ලකුණු 50)

II වන කොටස - කළමනාකරණ සහකාර සේවයට යෝග්‍යතාව මැනෙන සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් ගොඩනැගෙන කෙටි ප්‍රශ්න, ව්‍යුහගත ප්‍රශ්න හා රචනා (පැය 1 විනාඩි 15 යි - ලකුණු 50)

අභියෝග්‍යතාවය : (කාලය පැය 01)

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

බහුවරණ ප්‍රශ්න හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 යි.

(කාලය පැය 01)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

සටහන :- (i)සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත.

(ii) සෑම ලිඛිත උත්තර පත්‍රයකම නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.

18.0 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

19.0 මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2014 අගෝස්තු මස 15 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින්, රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2013 (2014)**

LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE III OF PUBLIC MANAGEMENT ASSISTANTS' SERVICE - 2013 (2014)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(ගැසට් නිවේදනය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න.)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :-GUNAWARDHANA M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

3.4 දුරකථන අංකය :

4.0 සේවා විස්තරය :

4.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :————.

4.2 එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව :———.

4.3 දැනට දරන තනතුරේ පදවි නාමය :————.

4.4 දැනට දරන තනතුරට පත් වූ දිනය :————.

4.5 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :————.

4.6 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේද යන වග :————.

4.7 සේවය ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය :————.

4.8 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :————.

4.9 දැනට ලබන වාර්ෂික වැටුප (ඒකාබද්ධ) :————.

4.10 වැටුප් පරිමාණය (2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව වැටුප් කේත):- පීඑල් 1-2006 ඒ/පීඑල් 2-2006 ඒ/පීඑල් -3 -2006 ඒ/ MN-01-2006A (අනවශ්‍ය වචන කපා හරින්න) :————.

4.11 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිත ද යන වග :———.

4.12 2014.09.29 දිනට දැනට දරන තනතුරේ සේවා කාලය :——.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැළවෙනසේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුදුසුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතීවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

***අත්සන සහතික කිරීම***

මාගේ කාර්යාලයේ නිලධරයකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................ මහතා/ මහත්මිය/ මෙනෙවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන.................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බව ද,
2. ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක 2014.09.29 දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
5. ඔහු/ඇය 2014.09.29 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර ඇති බව ද,
6. ඔහු/ඇය මෙම ගැසට් නිවේදනය 8.0 වැනි ඡේදයේ නියමිත සීමාවන් ඇතුළත ඇති වැටුප් ලබමින් හෝ වැටුප් ක්‍රමයක සිටින බව ද,
7. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2014.09.29 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවැති බව ද,
8. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
9. විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් ගෙවා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බව ද,
10. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද, මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*සංලක්ෂය :*

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාවය පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

08-1066

---

නිවැරදි කිරීමයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකයන් බඳවා ගැනීමේ තරග විභාගය - 2014

Competitive Examination for the recruitment of Teacher Assistants based on schools for Estate related schools of Tamil Medium - 2014

2014.08.08 දින පළ වූ අංක 1,875 දරන *ගැසට් පත්‍රයේ* ඉහත සඳහන් විභාග නිවේදනයේ 09 වැනි ඡේදයේ විභාග ගාස්තුව ගෙවිය යුතු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2013-02-13 ලෙස වැරදියට සඳහන් වී ඇත. එය විභාග ගාස්තුව ගෙවිය යුතු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ලෙස නිවැරදි විය යුතුය.

එම්. කොඩිප්පිලිආරච්චි,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
(ගුරු ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට.

08-116

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්**

අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

01. මුතූර් මහෙස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ පහත සඳහන් කර ඇති භාණ්ඩ මෙම අධිකරණයේ භූමිය තුළ තබා 2014.09.14 වැනි දින පෙ. ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇත.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවකු විසින් අයිතිය පවරනු ලබන්නේ නම්, තම ඉල්ලීම වෙන්දේසිය පටන් ගැනීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පටන් ගැනීමට පැය භාගයකට පෙර මහජනයා විසින් මෙම භාණ්ඩ නැරඹිය හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට තබා ඇති යම්කිසි භාණ්ඩයක වටිනාකමට මිළ නොලැබුනේ නම් වෙන්දේසියේ දී එම භාණ්ඩ ආපසු ලබා ගැනීමේ අයිතිය අධිකරණය සතු වනු ඇත.

05. විකුණනු ලැබූ භාණ්ඩවලට එවෙලෙහි ම මුදල් ගෙවා භාණ්ඩ වෙන් කළ යුතු යි. සෑම ගෙවීමක් ම මුදලින් ම ගෙවිය යුතු වන අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

අයි. පයස් රසාක්,
දිසා විනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මුතූර්.

ප්‍රසිද්ධ වෙන්දේසියේ ඉදිරිපත් කිරීමට නියමිත නඩු භාණ්ඩ පිළිබඳ විස්තර 2014

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | MC 27802 | ඊටෙල් ජංගම දුරකථනය | 01 |
| 02. | MC 22839 | ටීවී මොඩල් ජංගම දුරකථනය | 01 |
| 03. | MC 27604 | ඊටෙල් ජංගම දුරකථනය | 01 |
| 04. | MC 25425 | ග්‍රෑන්ටෙල් ජංගම දුරකථනය (GT100) | 01 |
| 05. | MC 22824 | ජී චයිනා ජංගම දුරකථනය | 01 |
| 06. | MC 21603 | කළුපාට නොකියා ජංගම දුරකථනය (E 89) | 01 |
| 07. | MC 24357 | රතුපාට ඒජී ටෙල් චයිනා ජංගම දුරකථනය (2600) | 01 |
| 08. | - | ආරක්ෂක හිස්වැසුම් | 04 |
| 09. | - | පලුදු බංකු (ඉන්වෙන්ට්‍රි) | 01 |
| 10. | AR 223/2011 | කලු පාට ලුමාලා පාපැදි | 01 |
| 11. | AR 243/2010 | හීරෝ පාපැදි ( R 594173) | 01 |
| 12. | MC 13114/2008 | කාන්තා පාපැදිය | 01 |
| 13. | MC 8876/2004 | කාන්තා ලුමාලා පාපැදි (55775445) | 01 |
| 14. | - | ලුමාලා පාපැදි (57151537) | 01 |
| 15. | AR 469/2013 | ලුමාලා පාපැදි (68448833) | 01 |
| 16. | MC 21473/2012 | ලුමාලා පාපැදි (69513999) | 01 |
| 17. | AR 243/2010 | ලුමාලා පාපැදි (57157152) | 01 |
| 18. | AR 467/2013 | ලුමාලා පාපැදි | 01 |
| 19. | - | ජපන් කාන්තා පාපැදිය ( BT 1110655) | 01 |
| 20. | AR 36/2011 | ලුමාලා පාපැදිය | 01 |
| 21. | MC 21585/2012 | ජපන් කාන්තා පාපැදිය | 01 |
| 22. | - | ජපන් කාන්තා පාපැදිය ( BT 10033225) | 01 |
| 23. | MC 13719/2009 | ලුමාලා පාපැදි | 01 |
| 24. | MC 19465/2011 | ලුමාලා පාපැදි | 01 |
| 25. | MC 20147 | ලුමාලා පාපැදි (69579571) | 01 |
| 26. | MC 14746 | ලුමාලා පාපැදි (55781973) | 01 |
| 27. | MC 15303 | ලුමාලා පාපැදි (55773165) | 01 |
| 28. | MC 14112 | ලුමාලා පාපැදි | 01 |
| 29. | BR 513/2011 | ලුමාලා පාපැදි | 01 |
| 30. | - | බෝට්ටු | 06 |
| 32. | - | හිස් යකඩ බැරල් | 15 |
| 33. | - | හිස් පොඩි ලොකු ප්ලාස්ටික් කෑන්, මුට්ටි | 25 |
| 34. | - | සවල් | 60 |
| 35. | - | උදලු | 04 |
| 36. | - | හිස් බෝතල් | 120 |
| 37. | - | මිට සමග පොරව | 12 |
| 38. | - | කරත්තය | 01 |
| 39. | - | පිහිය (පොඩි, ලොකු) | 20 |
| 40. | - | දිරාපත් වූ දර | $4m^3$ |
| 41. | - | පළුදු වූ බාල්දි | 6 |
| 42. | MC 24833 ( BR 574/2012) | රතුපාට ජැක් 3, දම්වැල් 3 යතුරු 8 | 14 |
| 43. | - | හොණ්ඩා CD 125 යතුරු පැදිය (En : CD 125 TE – 1038352, Ch : CD 125 T – 1038346) | 01 |
| 44. | AR 51/2012 | පළුදු වූ නිල් පැහැති TVS චම් යතුරු පැදිය (En : 0A2N 51003397, Ch: MD 611CA265IN03691) | 01 |
| 45. | - | පළුදු වූ යමහා CDL යතුරු පැදිය (En : F5B – 712818, Ch : F5B – 712818) | 01 |
| 46. | AR 170/2005 | හොණ්ඩා බෙල්ලි සුපර් යතුරු පැදිය (En: S110E -8058340, Ch: S 110E – 8041013) | 01 |
| 47. | - | ඩයන්ග් DX 100-18 චයිනා යතුරු පැදිය (Ch : LATPCGLJX32257777) | 01 |
| 48. | AR 157/2010 | LX48 නිල් පාට චයිනා යතුරු (En : LC139EMA – BO439610, Ch: LLCLXA10941BO2776) | 01 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 49. | MC 12486/2008 | ආසියා වීන්ග් AW125-W චයිනා යතුරු පැදිය (En : 156 FMI – 0208316, Ch : AW 125 -5-03010023) | 01 |
| 50. | - | පියාජින් සෝන්ග්ස් හෙන් (125) චයිනා යතුරු පැදිය (En: BYQ 156FMI-228800457, Ch: LBMPCJL2481023149) | 01 |
| 51. | AR 600/2012 | රතු පැහැති කොණ්ඩා 90 යතුරු පැදිය (En: MD90E-2115491, Ch : MD 90-2115352) | 01 |
| 52. | - | යමහා යතුරු පැදිය (En:36L407244, Ch: 36L-407244) | 01 |
| 53. | AR 21/2011 | ඩයඩු සුපර් කප් 50 යතුරු පැදිය (En: 1P47FMF-6D054588, Ch: ZMGXCFLV160H07213) | 01 |
| 54. | BR 830/2007 | TVS වික්ටර් යතුරු පැදිය (En: 0F1F41215592, Ch: MD 625BF1141F01996) | 01 |
| 55. | AR 437/2013 | ලොන්සින් LX 150-6E යතුරු පැදිය (En: LC161FMI-B0052728, Ch: LLCLP56E131B74323) | 01 |

08-886

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හම්බන්තොට**

**භාණ්ඩ වෙන්දේසි කිරීම**

මෙම අධිකරණය විසින් රාජසන්තක කරන ලද හෝ නියමිත දිනට හිමිකම් නොපෑ භාණ්ඩ පිළිබඳ වෙන්දේසියක් 2014.09.13 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී පැවැත්වෙන බව මෙයින් සියලු දෙනාටම දැනුම් දෙනු ලැබේ.

මෙම භාණ්ඩ මිලදී ගනු ලබන අවස්ථාවේ දී නියමිත මුදල් ගෙවා රිසිට්පතක් ලබාගත යුතු ය. චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර මිලට ගන්නා භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු ය.

මෙහි සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියේ දිනට පෙර දින තම හිමිකම් ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වනු ලැබේ.

රෙජිස්ට්‍රාර්වරයාගේ අධික්ෂණය පිට එදින පෙ. ව. 9.00 - 9.45 දක්වා භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගනු ලැබේ.

වෙන්දේසියේ බඩු මිලදී ගැනීම සඳහා පැමිණෙන සෑම අයෙක් ම තමාගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
හම්බන්තොට.

2014 ජූලි මස 02 වැනි දින,
හම්බන්තොට දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 8703 | අංක එස්. පී. එස්. ඒ. 0981 දරන අබලන් අත් ට්‍රැක්ටරය | 01 |
| 02. | 16309 | චැසි අංක සී. එෆ්. 55712 දරන අබලන් අත් ට්‍රැක්ටරය | 01 |
| 03. | 84826 | චැසි අංක 0100168 දරන අබලන් අත් ට්‍රැක්ටරය ඉංජින් කොටස | 01 |
| 04. | ඒ. ආර්. 420/09 | අංක 118-5306 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 05. | ඒ. ආර්. 364/12 | අංක 131-6781 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 06. | ඒ. ආර්. 106/13 | අංක එම්. ඩබ්. 7259 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 07. | ඒ. ආර්. 135/14 | අංක ජී. එච්. 7260 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 08. | ඒ. ආර්. 136/14 | අංක ජේ. එස්. 6875 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 09. | ඒ. ආර්. 137/14 | අංක ටී. එක්ස්. 4796 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 10. | 90733 | අංක 158-4492 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 11. | 92369 | අංක 137-3044 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 12. | 92229 | අංක 103 - 4275 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 13. | 10292 | චැසි අංක සී. එෆ්. 50 - 2723634 හා ඉංජින් අංක සී. එෆ්. 50 ඊ 2723677 | |
| | | අංක 135- 2441 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 14. | 89466 89467 | අංක 117- 0562 දරන අබලන් යතුරුපැදිය | 01 |
| 15. | 10041 | අංක 96- 1545 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 16. | 92138 | අංක 117-8660 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 17. | ඒ. ආර්. 729/13 | 1. අබලන් තත්ත්වයේ බෝට්ටු | 10 |
| | | 2. අබලන් තත්ත්වයේ පනිට්ටු | 11 |
| | | 3. සවල් | 04 |
| | | 4. අඩි 20 ගැල්වනයිස් බට | 03 |
| | | 5. ජංගම දුරකථන | 01 |
| 18. | ඒ. ආර්. 685/13 | අඟල් 02 ප්‍රමාණයේ විදුලියෙන් ක්‍රියා කරන වතුර මෝටර් | 02 |
| 19. | ඒ. ආර්. 909/13 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 20. | ඒ. ආර්. 910/13 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 21. | ඒ. ආර්. 683/13 | යූ. පී. සී. ඕ. වර්ගයේ ආරක්ෂිත හිස්වැසුම | 01 |
| 22. | 12904 | හේල වර්ගයේ අධිශීතකරණය (අබලන්) | 01 |
| 23. | 876313 | කේ. 75 අත්ට්‍රැක්ටරයක ගලවන ලද අමතර කොටස් | |
| 24. | 12966 | අලවංගු | 01 |
| | | උදලු | 02 |
| | | ඉල්ලංකුරු | 01 |
| | | ප්ලාස්ටික් තාච්චි | 01 |
| | | යකඩ පනිට්ටු | 01 |
| | | සුදු ඇල්මිනියම් පිඟන් | 04 |
| | | කුඩා ප්ලාස්ටික් බේසම් | 01 |
| | | ලී මිට සහිත මිටි | 01 |
| | | දුන් අල්ලන බඳුන් | 01 |
| 25. | 16430 | අලවංගු | 02 |
| | | ඉල්ලංකුරු | 02 |
| | | මන්න පිහි | 01 |
| | | කුලු ගෙඩි | 01 |
| | | නයිලෝන් කඹ | 01 |
| | | මිට කැඩී ඇති පිහි | 02 |
| | | ප්ලාස්ටික් තාච්චි | 01 |
| | | උදලු | 02 |
| 26. | 4325 | කලු පැහැති කැසට් රේඩියෝව | 01 |
| 27. | 14591 | යකඩ මිට සහිත උදලු | 08 |
| 28. | 58839 | ඇස්බැස්ටෝස් තහඩු | 10 |
| 29. | 87679 | චීනයේ නිෂ්පාදිත 3.2 x 350 වර්ගයේ වෙල්ඩින් කූරු | 100 |
| 30. | 13650 | විදුලි පන්දම් | 01 |
| | | යකඩ බොලොක්ක | 01 |
| | | ඉල්ලම් කූරු | 01 |
| | | යකඩ මිටි | 01 |
| | | යකඩ ගිරය | 01 |
| 31. | 97325 | අබලන් ස්ටා මෝටරය | 01 |
| 32. | 11352 | අඩි 05 දිග අඩි 01ක් පළල කිරිබත්කැටය හැඩැති යකඩ ග්‍රිල් | 02 |
| 33. | 14423 | යකඩ කූරු කොටස් | |
| 34. | 16314 | වී අඩංගු පොහොර මලු | 02 |
| 35. | 13093 | මන්න පිහි | 01 |
| 36. | 8978 | "ප" හැඩයට සකස් කරන ලද සුදු යකඩ බාර් එක | 01 |
| 37. | 7976 | උදලු | 01 |
| | | ඉල්ලං කූරු | 01 |
| 38. | 91207 | යකඩ කූරු කොටස් හා ජංගම දුරකථන | 01 |
| 39. | 12657 | අංකය අපැහැදිලි පාපැදි | 01 |
| 40. | 6355 | යකඩ කම්බිකූරු කොටස් හා අංකය අපැහැදිලි පාපැදි | 01 |
| 41. | 6705 | අඟල් 06 දිග හා විෂ්කම්භය 4/3 ප්‍රමාණයේ යකඩ මුරිච්චි 34ක් අඩංගු බාස්කට් | 01 |
| 42. | 7254 | අඩි 06ක් පමණ දිග කටු කම්බි කැබලි කිහිපයක් | |
| 43. | 8916 | ලී මිට සහිත සවල් | 01 |
| 44. | 9193 | උදලු | 01 |
| 45. | 9195 | ඉල්ලංකූඩ | 01 |
| 46. | 65554 | අංකය අපැහැදිලි අබලන් පාපැදි | 01 |
| 47. | 5594 | ලුනු පැකට් | 20 |
| 48. | 97656 | විදුලි පන්දම් | 01 |
| 49. | 10535 | අබලන් ජංගම දුරකථනය | 01 |
| 50. | ඒ. ආර්. 722/11 | අබලන් ජංගම දුරකථනය | 01 |
| 51. | 1030 | අබලන් ජංගම දුරකථනය | 01 |
| 52. | 93387 | ජංගම දුරකථනය හා කැති | 02 |
| 53. | 5101 | අබලන් ජංගම දුරකථන | 01 |
| 54. | 8696 | ජංගම දුරකථන | 01 |
| 55. | 10420 | අබලන් ජංගම දුරකථන | 01 |
| 56. | 85186 | කලුපාට ආවරණය සහිත කම්බි රෝල් | 03 |
| 57. | 13623 | මිට සහිත පොරව දෙබර වර්ගයේ ලී කනු | 29 |
| 58. | අංක රහිත | ඇල්මිනියම් කල | 06 |
| | | ඇලුමිනියම් මුට්ටි | 03 |
| 59. | අංක රහිත | ගැලුම් 45 යකඩ බැරල් | 03 |
| 60. | අංක රහිත | ප්ලාස්ටික් බූලි තොගයක් | - |
| 61. | අංක රහිත | ගැරුම් වට්ටි | 04 |
| | | ප්ලාස්ටික් තාච්චි | 03 |
| 62. | අංක රහිත | බෝතල් තොගයක් | - |
| 63. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ තෙල් මනින උපකරණ | 05 |

08-945

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

**වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් 31 වැනි දින දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2015 ජනවාරි 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාර ගනු ලැබේ.

01. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරය සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

02. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එකී කවරයේ වම් කෙළවරෙහි 'අංක .................. දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් සඳහන් කොට 2014.09.19 වැනි දින පෙ. ව. 10.30ට පෙර වත්තල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

03. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

04. 2014.09.19 වැනි දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. පූර්වාසන්න දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2014.11.12 වැනි දින පෙරවරු 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

06. මේ සම්බන්ධ වැඩි විස්තර වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2014 අගෝස්තු මස 05 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර්පත් බාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| වත්තල | අංක 01-තිඹිරිගස්යාය | 2014.09.19 පෙ. ව. 10.30 | 7,260 0 |
| වත්තල | අංක 02-උස්වැටකෙයියාව | එම | 4,840 0 |
| වත්තල | අංක 07-බෝපිටිය | එම | 7,260 0 |
| වත්තල | අංක 08-මහවත්ත | එම | 6,050 0. |

08-927

---

**මොණරාගල දිස්ත්‍රික්කය - බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 මාර්තු මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත් ව 2014 සැප්තැම්බර් මස 10 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. මෙම රේන්දය නැවත විකිණීම 2014 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 10.30 ට සිදු වේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත් වන අයට ටෙන්ඩර්පත් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ය. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර, මෙහි පහත ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් ඉල්ලුම් කරන ලද තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. එමෙන් ම ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්වල කරන ලද සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් විවෘත කරන දිනය වන 2014 සැප්තැම්බර් මස 10 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන්ට මෙම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2014 සැප්තැම්බර් මස 10 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් වේ.

05. යම්කිසි කරුණක් සටහන් නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කරන ලද දිනය, එනම් රේන්ද විකුණූ දින ප. ව. 2.00 ට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මාස දෙකක රේන්ද මුදල් කොටසකට නොවැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

කසුන් එස්. කේ. වැල්ලහේවා,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2014 අගෝස්තු මස 05 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*2015 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව - මොණරාගල දිස්ත්‍රික්කය*

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ග්‍රාමය | තැබෑරුම විවෘත කර තබන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 01. | මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පල්ලේවරාදොල | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා නැවත ප. ව. 4.00 සිට ප. ව. 8.00 දක්වා | 500.00 | 2014.09.10 දින පෙ. ව. 10.30 |

08-887

---

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

ඇල්පිටිය, පිටුවල, නරවැල්කැටිය, "පුෂ්පා" හි පදිංචි පුෂ්පා කාන්ති ෆැල්කනර් (වි. පෙ. කොඩිතුවක්කු ජයසේකර පුෂ්පා කාන්ති) වන මා ඇල්පිටිය, පිටුවල, නරවැල්කැටිය, "පුෂ්පා" හි පදිංචි කාරියවසම් අඹගහවත්තගේ දයානන්ද වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. එල්. එස්. නිල්මිණි කේ. කුරුප්පුආරච්චි විසින් ලියා සහතික කළ අංක 413 සහ වර්ෂ 2008.03.26 දිනැති ඇටර්නි බලපත්‍රය වර්ෂ 2014.08.04 වැනි දින සිට බලරහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසු ඔහු විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

08-855

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : ෂෝට්වුන් බී ටී එල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 99632
ලියාපදිංචි කළ දිනය : 2014.07.10

කාර්යාලයීය ලිපිනය : අංක 163/15, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.
එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.
08-872

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.
සමාගම් නාමය : එස්. ජී. එම්. ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 99453
ලියාපදිංචි කළ දිනය : 2014.07.02
කාර්යාල ලිපිනය : අංක 163/15, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.
එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.
08-873

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ නම : සන්සෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74428
සංස්ථාගත කළ දිනය : 2010.09.20
ලියාපදිංචි කාර්යාලය : අංක 154/4, නාමල් පෙදෙස, කටුවාවන පාර,
හෝමාගම.
අධ්‍යක්ෂ මණ්ඩලය.

08-874

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

1. සමාගමේ නම : ඩේටා ප්‍රොසෙසිං ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී
2. අංකය : පී වී 100057
3. ලියාපදිංචි කළ දිනය : 2014.08.04
4. ලියාපදිංචි ලිපිනය : අංක 104, කිතුල්වත්ත පාර, කොළඹ 08.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගමේ ලේකම්.

නීතිඥ සමාගමේ ලේකම්,
ඩේටා ප්‍රොසෙසිං ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී.
08-880

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 9 (1) වගන්තිය විධිවිධාන ප්‍රකාරව කරන දැනුම් දීමයි.
සමාගමේ නම : ඇමෙක්ස් ඉන්ටීරියස් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 99041
සංස්ථාගත කළ දිනය : 2014 ජූනි 10 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 240, එම්. ජේ. එම්. ලාෆීරා මාවත,
කොළඹ 12.
ලේකම්වරු.

08-883

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2012.03.19 වැනි දිනැති අංක 2743 දරන කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. කුලසිංගම් මහතා විසින් සහතික කරන ලද යාපනය, නල්ලූර් චෙට්ටි වීදියේ පටුමග, අංක 34 හි පදිංචි වෙට්ටිවේලු යජන්තිරන් යන අයට කොළඹ 06, අරතුසා පටුමග, අංක 19 හි පදිංචි විනිප්‍රිඩා ප්‍රේබා යජන්දිරන් වන මා විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2014.07.11 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

විනිප්‍රිඩා ප්‍රේබා යජන්දිරන්.

2014 ජූලි මස 11 වැනි දින.
08-895

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය**

සමාගමේ කලින් නම : ආර්ක් ටෙක්නොලොජීස් (පී වී ටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 93860
ලියාපදිංචි කාර්යාලය : අංක 78, 1/1, හැව්ලොක් පාර, කොළඹ 5
සමාගමේ නම : සෙයිලාඕ ලෑන්ඩ් (පී වී ටී) එල්ටීඩී
08-896

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1)**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : ෆෙලෙක්සිමැක් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 99604
ලියාපදිංචි කාර්යාලය : ලේකම්වරුන් භාරයේ, ඒ/1/1, 1 වැනි මහල, 260,
ඇල්විටිගල මාවත, කොළඹ 8
සමාගමේ නම : කළුසුද්දා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 99747
ලියාපදිංචි කාර්යාලය : අංක 25/10, රණවකවත්ත, කලල්ගොඩ, පන්නිපිටිය.
සමාගමේ නම : ස්ටෙලාර් ප්‍රොජෙක්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 99780
ලියාපදිංචි කාර්යාලය : අංක 1, කාසල් ඇවනියු, කොළඹ 08
08-897/1

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1)**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : ඇක්වා බයෝ මිනරල්ස් (පී වී ටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 98725
ලියාපදිංචි කාර්යාලය : 16/ඒ, ශ්‍රී මහා විහාර පාර, දෙහිවල.
සමාගමේ නම : ජේ. ආර්. ඇග්‍රෝ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99130
ලියාපදිංචි කාර්යාලය : අංක 51/1, මීගමු පාර, වත්තල.
සමාගමේ නම : මැග්රූෆ් ඩිස්ට්‍රිබියුටර්ස් (පී වී ටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 99454
ලියාපදිංචි කාර්යාලය : අංක 116, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14.
08-897/2

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| ලියාපදිංචි සමාගමේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය | ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය |
|---|---|---|---|
| වී එල් ඒ ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 99669 | 2014.07.14 | අංක 01-එෆ්/4, ජාතික නිවාස යෝජනා ක්‍රමය, මත්තේගොඩ |
| ඉන්ස්ටිටියුට් ඔෆ් ෆොරෙන්සික් ඔඩිටර්ස් ඇසෝසියේෂන් | පී. වී. 2939 | 2014.07.02 | අංක 623/25 ඒ, රාජගිරිය උද්‍යානය, රාජගිරිය |
| පැනෝටා ඉන්ටර්නැෂනල් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී | පී. වී. 74138 | 2010.09.03 | අංක 164/1, ජෝන් පෙරේරා මාවත, කන්ඩවල, කටාන. |

ආර්. කේ. එල්. එස්. කොපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී.,
සමාගම් ලේකම්වරු.

08-871

වැනි දින ලියා සහතික කළ අංක 967 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මත පාදුක්ක අරුක්වත්ත ගනේගොඩ පෙදෙස අංක 163 බී, ලිපිනයේ පදිංචි කලුවහුම්පුරගේ අජිත් අසංක යන අය වෙත දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ද, එකී ඇටර්නි බලපත්‍රය මත කරනු ලබන කිසිදු ක්‍රියාවක් 2014.08.01 වැනි දින පටන් වලංගු නොවන බව ශ්‍රී ලංකා ජන රජයටත් සියලු දෙනාටමත් මෙයින් දන්වා සිටිමි.

08-905

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 05, හැව්ලොක් පාර, අංක 109, එපාට්මන්ට් 5/2, ස්පැතෝඩියා රෙසිඩන්සීස් හි සහ දැනට ඕස්ට්‍රේලියාව, එන්. එස්. ඩබ්. 2260, වැම්බර්ල්, බීලුබෙල් ඩ්‍රයිව්, අංක 90 හි පදිංචි හරීන්ද්‍ර නිරංජන් ඩයස් (අංක එන් 5059146 දරන ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍රය හිමි) වන මා එකී ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනයාට දන්වා සිටින වගනම්, නුගේගොඩ, චැපල් පටුමග, අංක 42/2 හි පදිංචි වර්ණකුලසූරිය රේමන්ඩ් ජොන්සන් පීරිස් (අංක 512990517 වී දරන ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත හිමි) යන අයට බලය පවරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සුමනදාස විසින් ලියා සහතික කරන ලද අංක 18 හා 2011 ජනවාරි මස 07 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය අවලංගු සහ බලරහිත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 18 දරන එකී ඇටර්නි බලකරය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු සහ බලරහිත වේ.

2014 ජුනි මස 30 වැනි දින.
08-906

**මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2014 අගෝස්තු මස 04 වැනිදා ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.
සමාගමෙහි නම : එම්. එච්. එම්. සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100041
ලියාපදිංචි කාර්යාලය : අංක 18, දුම්රිය පොළපාර, අම්බලන්ගොඩ
ටීස් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සෙක්රටරීස්,
(පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්.

අංක 2ඒ 1/1, රංජන් පාර,
දුම්රියපොල පාරෙන් හැරී,
කොළඹ 06.
08-907

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2014 ජූලි මස 25 වැනි දින සිදුකරන ලද සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම මෙලෙස පහත දක්වනු ලැබේ.
සමාගමේ නම : එෆ්. පී. ඩී. සිලෝන් එන්ටර්ප්‍රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99181
ලියාපදිංචි ලිපිනය : අංක 4, කුමාරදාස පාර, හිත්තැටිය, මාතර.
ජෙසී ඇන්ඩ් කම්පැනි,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනිව්,
කොළඹ 07.
08-910

**විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

බෙන්තොට, ගෝනගලපුර, දොඹගහවත්ත, අංක 271 දරන ස්ථානයේ පදිංචි (ජර්මනිය, මියුනිච්, 81667, 14, වොල්ෆ්ගැනා වීදිය දරන ලිපිනයේ ද පදිංචි) ඇන්ටන් නිකොලස් රයිට්මයර් වන මා විසින් මහඉඳුරුව, නෙළුම් පොකුණගම, අංක 135 දරන ස්ථානයේ පදිංචි අගම්පොඩි පූර්නා චන්ද්‍රානි මෙන්ඩිස් විජේසිංහ වෙත ප්‍රදානය කරන ලද ජයන්ත ජයවීර ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් වර්ෂ 2013 ජනවාරි මස 27 වැනි දින ලියා සහතික කරන ලද අංක 1737 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්ටන් නිකොලස් රයිට්මයර්.

2014 ජූලි මස 23 වැනි දින දී ය.
08-915

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2013.01.19 වැනි දිනැති ජූරා දිස්ත්‍රික්කයේ නොතාරිස් වන Hubert Frelechoux විසින් සහතික කරන ලද කොළඹ - 06, 57 වැනි පටුමග, අංක 5-6/1 හි පදිංචි රාජමනි ශිවගුමාර් යන අයට Rue du Creugenat 12, 2900 Porrentruy (JU), Switzerland හි පදිංචි මුරුගුපිල්ලයි ප්‍රිම් නවාස් සහ මල්ලිකාවති ප්‍රිම් නවාස් වන අප විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2014.08.10 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවර වලට අප වගකියනු නොලැබේ.

මුරුගුපිල්ලයි ප්‍රිම් නවාස්,
සහ මල්ලිකාවති ප්‍රිම් නවාස්.

2014 අගෝස්තු මස 10 වැනි දින.
08-916

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2013.11.12 වැනි දිනැති අංක 350 දරන කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. අම්ර්දනාදර් විසින් සහතික කරන ලද කොළඹ 06, අරතුසා පටුමග, අංක 19 හි පදිංචි වෙට්ටිවේලු යහන්තිරන් යන අයට කොළඹ 06, අරතුසා පටුමග, අංක 14-6/3 හි පදිංචි විනි ප්‍රිඩා වෙට්ටිවේලු යජන්දිරන් වන මා විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2014.07.11 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවර වලට මා වගකියනු නොලැබේ.

විනි ප්‍රිඩා වෙට්ටිවේලු යජන්දිරන්.

2014 ජූලි මස 01 වැනි දින,
08-917

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමි.
නම : ෆැබර් කැපිටල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99958
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි 31 වැනි දින.
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 32/1, කාසල් වීදිය, කොළඹ 08.
අධ්‍යක්ෂ.

08-930

**සමාගමක් සංස්ථාගත කළ බව දැනුම්දීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙමු.
සමාගමේ නම : එවර් ෆෝකස් සිකුරිටි සර්විස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 83734
සංස්ථාගත කළ දිනය : 2012 ජනවාරි මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 428/35/04,
අරලිය උයන, ආඩිඅම්බලම, කටුනායක.
අධ්‍යක්ෂක මණ්ඩලය.

08-936

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි.
නම : ඔප්සෙල් ෆොන් ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2014.06.23
ලි. ප. අංක : පී වී 99264
ලිපිනය : අංක 469/1, ලේක් පාර, අකුරේගොඩ, තලංගම දකුණ,
බත්තරමුල්ල.
සමාගම් ලේකම්වරු.

08-938

**ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

කඩවත, සූරිගම, 1 වන පටුමග අංක 207/24 පදිංචි මඩපාතගේ දොන් සමරසේන සේනානායක වන මම, එල්. ඒ. තුසාරි පලිහවඩන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2009.09.10 වැනි දින අංක 186න් සහතික කොට දෙහිවල, පැරකුම් මාවත, අංක 177/8 පදිංචි මඩපාතගේ දොන් ආරියදාස සේනානායක වෙත පවරන ලද ඇටෝර්නි බලය, 2014 ජූලි මස 18 වැනි දින සිට අවලංගු කොට බලරහිත කරන ලද බව මෙයින් දන්වනු කැමැත්තෙමි. එකී දින සිට, පෙරකී ඇටෝර්නි බලය යටතේ, මගේ නමින් හෝ මා වෙනුවෙන් ඉහත නම සඳහන් මඩපාතගේ දොන් ආරියදාස සේනානායක විසින් කරනු ලබන කිසිදු ගණුදෙනුවක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් මා විසින් භාරගනු නොලැබේ.

මඩපාතගේ දොන් සමරසේන සේනානායක.

08-946

**ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුගාමීව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ නම : ඉනොවේටිව් ඉන්වෙස්ට්මන්ට්ස් කො. (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91982
ලියාපදිංචි ලිපිනය : අංක 549/7, සුධර්ම පාර, වනවාසල, කැලණිය
ලියාපදිංචි දිනය : 2013 අප්‍රේල් මස 8 වැනි දින.
ලේකම්.

08-953

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නාමය 2014 ජූලි මස 14 වැනි දා සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමි.
පෙර නාමය : ක්වන්ටම් ලයිටින් (පුද්ගලික) සමාගම
නව නාමය : යුරෝපා ලයිටින් (පුද්ගලික) සමාගම
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 89083
ලියාපදිංචි ලිපිනය : අංක 33, ශාන්ත මයිකල් මාවත, කොළඹ 03
කොන්ෆිෆි මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරුන්.

08-982

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි**

වැල්ලම්පිටිය, කුමාරදාස පෙදෙස, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි විලේගොඩ ආරච්චිගේ මනෝජ් රසාංග රුවන් පෙරේරා (ජා. හැ. අ. 841330021 වී) වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් වැල්ලම්පිටිය, කුමාරදාස පෙදෙස, අංක 58 දරන ස්ථානයෙහි පදිංචිව සිටි දැනට කැලණිය, ඊරියවැටිය, විහාර මහාදේවි පාර, අංක 551 ඩී දරන ස්ථානයේ පදිංචි විලේගොඩ ආරච්චිගේ දිනේෂ් උදය රුවන් පෙරේරා (ජා. හැ. අ. 711132597 වී) යන අයව පත් කරමින් ප්‍රසිද්ධ නොතාරිස් සමන්ත පී ප්‍රනාන්දු මහතා විසින් වර්ෂ 2005 අප්‍රේල් මස 07 වැනි දින ලියා සහතික කරන ලද අංක 84 දරන ඇටෝර්නි බලපත්‍රය මෙතැන් සිට අවලංගු කොට බලරහිත කළ බවත්, මින් මතුවට එකී ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු නෛතික වලංගුතාවක් නැති බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

විලේගොඩ ආරච්චිගේ මනෝජ් රසාංග රුවන් පෙරේරා.

2014 ක් වූ අගෝස්තු මස 06 වැනි දින.
08-983

**මෙඩිකෝර්ප් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි.
මෙඩිකෝර්ප් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වර්ෂ 2014 ක් වූ ජූලි මස 28 වැනි දින සීමිත පෞද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99956
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 17/9, දේවානන්ද පාර,
නාවින්න, මහරගම.
ඩයනි සී. මිල්ලවිතානාච්චි,
සමාගම් ලේකම්.

08-985

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ 2014.07.11 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : යුනියන් ඇෂුවරන්ස් ජෙනරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99666
සංස්ථාගත කළ දිනය : 2014.07.11

සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 20, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03
සමාගම් ලේකම් : කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්ගේ අණ පරිදි.

08-986

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාමිනියාව කෝරළේ, කැකිරාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අංක 620 කැකිරාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඕළුකරඳ ග්‍රාමයේ පිහිටි "දුම්මිල්ලවල මූකලාන (උස් ඉඩම)" (LDO ප්‍රධාන අංක Anu/Keki/Pra/191හි විස්තර කොට ඇති ඉඩම වන) යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සාදන ලද 1994 ජුනි 30 දාතම හා අංක F.V.P. 823 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 132 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 02, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 133 සහ 136, දකුණට : මෙම පිඹුරේ ලොට් 137 සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 167 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි නමයයි අටක් (0.398)ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් සමූහයේ ලේකම්.

08 - 1047/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එම්. ආර්. බදුර්දීන්,
ගිණුම් අංක : 0029 5001 4655.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014.06.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ අසූ පන් දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනස් නමයක (රු. 14,785,271.59) මුදලද, 2013 මැයි 18 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි තිස්හතර ලක්ෂ අසූ පන් දහස් නමසිය හැට දෙකයි ශත විසි නමයක (රු. 13,485,962.29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහස් දේපළ සහ පරිශ්‍රයන් 2013.08.08 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.07.31 දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති ඇති පරිදි 2014.09.24 දින පෙ.ව. 11.00ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනැම්දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කළුබෝවිල ජයා මාවත හි පිහිටි (කලින් කළුබෝවිල, පන්සල පාර, වරිපනම් අංක 59/3) කළුබෝවිල පන්සල පාර වරිපනම් අංක 45 9/B/1 දරන "කොටුවේකුඹුර, කඳුරුගහවත්ත, කදුරුගහකුඹුර, පට්ටියේවත්ත, කොළඉන්නේවත්ත, මීගහවත්ත, පාවුලාඹිට්ට, මීගහවත්ත, මාදංගහවත්ත සහ මාදංගහකුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ජේ. ද සිල්වා යන අය විසින් සාදන ලද (1992 නොවැම්බර් 16 වන දින සත්‍ය පිටපතක් වශයෙන් සහතික කළ) 1986 මැයි 28 දාතම හා අංක 2018 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3A1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 929 දරන පිඹුරේ ලෙට් 6 සහ ලොට් 3A2, නැගෙනහිරට : අංක 586 දරන පිඹුරේ ලොට් 4, ලෝට් 5B සහ 3A2 සහ අංක 586 දරන පිඹුරේ ලොට් 6, දකුණට : අංක 929 දරන පිඹුරේ ලොට් 3B ලොට් 3A2 සහ බස්නාහිරට : අඩි 10 පළල පාර (අංක 929 දරන පිඹුරේ ලොට් 11) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම නමයයි එකක් (A. 0, R. 0, P. 18.91) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද, සමග එකී අංක 2018 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M 3332/30 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

බලයලත් මානත තැන එස්. ජෙගතීසන් යන අය විසින් සාදන ලද 1974 නොවැම්බර් 24 දාතම හා අංක 1965 දරන පිඹුරේ නිරූපිත ලොට් 11 සහ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 1711/248 යටතේ ලියාපදිංචි කොට ඇත.

අංක 2018 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 5B දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 1525/82 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමූහ සමාගම් ලේකම්.

08 - 1047/3

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 396

MOD/DEF/2/01/ARF/RET/453.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 නොවැම්බර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් රොහාන් අනිල් කඩුවෙල (නි/50941)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

08-1055

---

2014 අංක 397

MOD/DEF/2/01/ARF/RET/459.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 සැප්තැම්බර් මස 14 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිතන් කර්නල් මහගනි ආරච්චිගේ අනුරාධ ජයසංඛ කුලරත්න පීඑස්සී ශ්‍රීලංසංබ (නි/61732)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 සැප්තැම්බර් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් මහගනි ආරච්චිගේ අනුරාධ ජයසංඛ කුලරත්න පීඑස්සී ශ්‍රීලංසංබ (නි/61732)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08-1062

---

2014 අංක 398

MOD/DEF/2/01/ARF/CONF/MAJ/11.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

1. කපිතන් (තාවකාලික මේජර්) හේරත් රාලලාගේගෙදර විජේරත්න බණ්ඩාර, ගරෙ (නි/60988) - 2000.06.02 ;
2. කපිතන් (තාවකාලික මේජර්) වැලිසරගේ ජූඩ් ඉන්දිර ප්‍රනාන්දු, ගරෙ (නි/61023) - 2001.06.10 ;
3. කපිතන් (තාවකාලික මේජර්) විදානගේ සුජිත් ධර්මප්‍රිය, විපාරෙ (නි/61437) - 2003.04.05 ;
4. කපිතන් (තාවකාලික මේජර්) සේනාධිරගේ අරෝෂ අනෝජ් කුමාර් පිරිස්, ශ්‍රීලයුබෙ (නි/62190) - 2004.11.11 ;
5. කපිතන් (තාවකාලික මේජර්) බියන්විලගේ කපිල ඇනස්ලි ප්‍රසන්න දරිජු, ශ්‍රීලසසබ (නි/62375) - 2006.03.10 ;
6. කපිතන් (තාවකාලික මේජර්) විතාරන ගෙදර දමිත් බන්ඩාර හේවාවිස්ස, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/62239) - 2006.08.18 ;
7. කපිතන් (තාවකාලික මේජර්) ක්‍රිෂ්ණදාස මුදියන්සේලාගේ ජයන්ත බණ්ඩාර ක්‍රිෂ්ණදාස, කරෙ (නි/62301) - 2007.01.30 ;
8. කපිතන් (තාවකාලික මේජර්) අරුණ හේමකුමාර විජේගුණවර්ධන, ආර්එස්පි ශ්‍රීලපාහ (නි/62303) 2007.01.30 ;
9. කපිතන් (තාවකාලික මේජර්) කොලොන්ගහපිටිය හේරත් මුදියන්සේලාගේ උදයසිරි බණ්ඩාර කොලොන්ගහපිටිය, ගැහේබ (නි/63080) - 2008.06.05 ;
10. කපිතන් (තාවකාලික මේජර්) හේමක රොෂාන් සෙනවිරත්න පීඑස්සී, ශ්‍රීලකාහ (නි/63239) - 2008.06.29 ;
11. කපිතන් (තාවකාලික මේජර්) හේවා දේවගේ ටයිටස් ජයකොඩි, ශ්‍රීලපාහ (නි/63246) - 2008.06.29 ;
12. කපිතන් (තාවකාලික මේජර්) හෙම්බා තන්ත්‍රීගේ හේමන්ත පුෂ්පකුමාර දයාරත්න, ශ්‍රීලපාහ (නි/63255) - 2008.06.29 ;
13. කපිතන් (තාවකාලික මේජර්) තිත්තගල්ල ගමගේ ඉරාජ් අයෙස්මන්ත ආරියරත්න, ආර්එස්පී ශ්‍රීලකාහ (නි/62835)- 2008.06.30 ;
14. කපිතන් (තාවකාලික මේජර්) කන්දෙ ගමරාලලාගේ පෙමින්ද කුමාර කරුණාරත්න, ශ්‍රීලයුසේබ (නි/62853) - 2008.06.30 ;
15. කපිතන් (තාවකාලික මේජර්) හබරාදුව කන්කානම්ලාගේ ලක්මින් සමිර සිල්වා, ඉසේබ (නි/64391) - 2009.04.22 ;
16. කපිතන් (තාවකාලික මේජර්) නමින්ද සුමිත් නල්ලපෙරුම, ශ්‍රීලයුපොදුසේබ (නි/65101) - 2009.05.28 ;
17. කපිතන් (තාවකාලික මේජර්) දසනායක මුදියන්සේලාගේ තුසන්ත බණ්ඩාර දසනායක, ගරෙ (නි/63201) - 2009.07.27 ;
18. කපිතන් (තාවකාලික මේජර්) ගොරකානගේ තරංග ශිරාන් සිල්වා, ශ්‍රීලයුයුබ (නි/63478) - 2010.01.06 ;
19. කපිතන් (තාවකාලික මේජර්) අබේවික්‍රම විදාන ආරච්චිගේ රංග කුෂාන් අබේවික්‍රම, ආර්එස්පී විපාරෙ (නි/63490) - 2010.01.06 ;
20. කපිතන් (තාවකාලික මේජර්) වියතුංග අප්පුහාමිලාගේ සුමිත් ප්‍රියන්ත වියතුංග, විපාරෙ (නි/61482) - 2010.01.07 ;
21. කපිතන් (තාවකාලික මේජර්) හොන්නන්තරගේ දොන් මනෝජ් ප්‍රියංග වීරසිංහ, ඉසේබ (නි/64584) - 2010.03.17 ;
22. කපිතන් (තාවකාලික මේජර්) රොෂාන් මහේන්ද්‍ර සුභසිංහ, ශ්‍රීලංඉ (නි/63505) - 2010.03.17.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින
කොළඹ දී ය.

08 - 1064

---

2014 අංක 399

MOD/DEF/2/01/ARF/RET/469.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 31 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් පාදුක් ගමරාලලාගේ නන්දන පුෂ්ප කුමාර, ගැහේබ (නි/63855).

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් පාදුක් ගමරාලලාගේ නන්දන පුෂ්ප කුමාර, ගැහේබ (නි/63855)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

08-1058

---

2014 අංක 400

MOD/DEF/2/01/ARF/RET/358.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් හා විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජුනි මස 17 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් ලංකාපේලිගේ අජන්ත ශ්‍රී ආනන්ද, ශ්‍රීලංසංබ (නි/63642).

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජුනි මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ලංකාපේලිගේ අජන්ත ශ්‍රී ආනන්ද, ශ්‍රීලංසංබ (නි/63642)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.
08-1063

---

2014 අංක 401

MOD/DEF/2/01/ARF/RET/446.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් සුනෙත් දර්ශන ජයකොඩි, ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලසසබ (නි/61942).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-1056

---

2014 අංක 402

MOD/DEF/2/01/ARF/RET/465.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 දෙසැම්බර් මස 12 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික මේජර් සෙනරත් පතිරණලාගේ අනුර පුෂ්ප කුමාර, විපාරෙ (නි/63712).

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 දෙසැම්බර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් සෙනරත් පතිරණලාගේ අනුර පුෂ්ප කුමාර, විපාරෙ (නි/63712)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-1061

---

2014 අංක 403

MOD/DEF/2/01/ARF/PRO/MAT/03.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හාමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම් පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවගාලික මේජර් නිලයට උසස් කිරීම අනුමත කර තිබේ :

(අ) කපිතන් බිලින්ද දේවයලාගේ චතුර රණසිංහ මඩහපොල, ශ්‍රීලකාහ (නි/66058) - 2013 ජූලි 18 ;
(ආ) කපිතන් ජයසූරිය ආරච්චිලාගේ චමින්ද රෝහණ ජයසූරිය, කරෙ (නි/66059) - 2013 ජූලි 18 ;
(ඇ) කපිතන් මුකදන්ගෙයි අමිල සේනක සේනාරත්න, ශ්‍රීලසසබ (නි/66061) - 2013 ජූලි 18 ;
(ඈ) කපිතන් ඕෂිත දෙනෙත්ති ශ්‍රීලංසංබ (නි/66062) - 2013 ජූලි 18
(ඉ) කපිතන් මාරඹගේ ප්‍රභාත් ඉන්දික අමරසේන, ශ්‍රීලයුපොදුසේබ (නි/66064) - 2013 ජූලි 18 ;
(ඊ) කපිතන් නිකවෙල හරමානිස්ගේ ලයාන් ප්‍රබෝධ මධුෂංක නිකවෙල, විපාරෙ (නි/66069) - 2013 ජූලි 18 ;
(උ) කපිතන් චිත්‍රා ආරච්චිගේ ගයාන් විකසිත චිත්‍රසේන, ශ්‍රීලපාහ (නි/66070) - 2013 ජූලි 18 ;
(ඌ) කපිතන් කරුණාදාසගේ දීපාල් ශ්‍රීනාත් ගැහේබ (නි/66071) - 2013 ජූලි 18 ;
(එ) කපිතන් බෝරල පතිරණගේ රුවන් චමින්ද ජයරත්න, විපාරෙ (නි/66076) - 2013 ජූලි 18 ;
(ඒ) කපිතන් සෙන්ද හන්දිගේ උවින්ද දිලාන් වීරවංශ, විපාරෙ (නි/66077) - 2013 ජූලි 18 ;
(ඔ) කපිතන් සේරසිංහ හෙට්ටි ආරච්චිගේ උමේෂ් විජේසිංහ, විබ (නි/66079) - 2013 ජූලි 18 ;
(ඕ) කපිතන් රාජපක්ෂ රත්නායක මුදියන්සේලාගේ කන්කානම් ගෙදර මංජු සම්පත් රත්නායක, ගැහේබ (නි/66080) - 2013 ජූලි 18 ;
(ක) කපිතන් වාසලමුණි ආරච්චිල්ලාගේ අරුණ ශ්‍රී උපුල් සංජීව, ශ්‍රීලංසිරෙ (නි/66083) - 2013 ජූලි 18 ;
(ග) කපිතන් රන්ගේගම ගම්ලද්දලාගේ බුද්ධික සම්පත් ප්‍රේමරත්න, ශ්‍රීලයුපොහේබ (නි/66094) - 2013 ජූලි 18 ;
(ජ) කපිතන් ගීතා සමන්මලී රන්කොත්ගේ ශ්‍රීලයුකාබ (නි/65757) - 2013 ජූලි 18 ;
(ට) කපිතන් සුභසිංහගේ චමරි උදයංගනී පෙරේරා, ශ්‍රීලයුකාබ (නි/65758) - 2013 ජූලි 18 ;
(ඩ) කපිතන් ශිරෝමාලා කුමුදුනී මිරියගල්ල, ශ්‍රීලයුකාබ (නි/65759) - 2013 ජූලි 18 ;
(ණ) කපිතන් දෝන චතුරිකා නිශානි බෝඹුවල, ශ්‍රීලයුකාබ (නි/65760) - 2013 ජූලි 18 ;
(ත) කපිතන් ජනිතා රශ්මි ප්‍රභා කුමාරි ගල්හේන, ශ්‍රීලයුකාබ (නි/65761) - 2013 ජූලි 18 ;
(ද) කපිතන් බස්නායක රාළලාගේ සවෝමි ගෝතමාදරා බස්නායක, ශ්‍රීලයුකාබ (නි/65762) - 2013 ජූලි 18 ;
(න) කපිතන් ඉරෝෂිනි ප්‍රදීපිකා වනසිංහ, ශ්‍රීලයුකාබ (නි/65764) - 2013 ජූලි 18 ;
(ප) කපිතන් හෙට්ටි ආරච්චිගේ අනුර නයනකාන්ත, ශ්‍රීලයුවෛබ (නි/67356) - 2013 අගෝස්තු 13 ;

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 27 වැනි දින
කොළඹ දී ය.
08 - 960

---

2014 අංක 404

MOD/DEF/2/01/ARF/REM/468.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීම

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජුනි මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) පල්කුඹුරේ ජයසිංහ හේනලාගේ සරත් සේනාධීර, ආර්එස්පී ශ්‍රීලකාහ (නි/66208).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-1053

---

2014 අංක 405

MOD/DEF/02/01/ARF/RET/464.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 ජනවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) සිංහලගේ ආනන්ද රාජරත්න, ශ්‍රීලංසිරෙ (නි/66374)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-1057

---

2014 අංක 406

MOD/DEF/02/01/ARF/REM/467.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් සුබවීරගේ ටෙරීන් ගයාන් ඩයස්, ශ්‍රීලංසංබ (නි/67207).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-1054

---

2014 අංක 407

MOD/DEF/2/01/ARF/RET/457.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 නොවැම්බර් මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් හෙනරත් හෙට්ටි ආරච්චිලාගේ සුගත් චන්දන ශ්‍රීලකාහ (නි/66572)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
08-959

---

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/32/2014/පිටු/සැ.

**ඉඩම් ලියපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තියට අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.08.29 වැනි දින සිට 2014.09.12 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාර කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමැති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.09.19 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කල අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වැල්ල දරන කොට්ඨාසයේ 48 වෙළුමේ 233, 234 පත්ඉරු | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, කොළඹ, මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්ත, කොලින්වුඩ් පෙදෙසෙහි පිහිටි කුඩාවැල්ලවත්ත' නැමැති ඉඩමේ අංක 376 F1D1 දරන කැබැල්ලට ජේ. පී. මෙලනි මානක තැන විසින් 1944.07.08 දින මැන සාදන ලද අංක 1211 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br>උතුරට : කොලින්වුඩ් පෙදෙස (ලොට් 376 D7) ;<br>නැගෙනහිරට : ලොට් 376 FIC ;<br>දකුණට : ලොට් A ;<br>බස්නාහිරට : නගර සභාවට අයත් අගල ;<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, ප. 39.62. | 01. සී. ඩී. තිලයිවාසන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1944.08.28 දින අංක 04 දරන විකුණුම් ඔප්පුව.<br>02. එෆ්. සී. ද සේරම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1957.10.18 දින අංක 409 දරන විකුණුම් ඔප්පුව.<br>03. එෆ්. සී. ද සේරම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1957.10.18 දින අංක 410 දරන උකස් ඔප්පුව.<br>01. ඊ. ජේ. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1954.10.22 වැනි දින අංක 512 දරන උකස් බැඳුම්කරය |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
08 - 1065

---

**වන්දනා ගමන් ආඥාපනත**

කිරිඳිගල්ල ශ්‍රී විෂ්ණු මහා දේවාල වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2014

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිඳිගල්ල ශ්‍රී විෂ්ණු මහ දේවාලයේ, වාර්ෂික පෙරහැර මංගල්‍යය 2014 අගෝස්තු මස 29 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. ඒ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

2014ක් වූ අගෝස්තු මස 14 වැනි දින,
ඉබ්බාගමුව
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
08-1077/1

**වන්දනා ගමන් ආඥාපනත**

කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාල වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2014

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ, වාර්ෂික පෙරහැර මංගල්‍යය 2014 සැප්තැම්බර් මස 06 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. ඒ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

2014ක් වූ අගෝස්තු මස 14 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
08-1077/2

---

**උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2014**

1. උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ ඇසළ උත්සවය 2014 ඔක්තෝබර් මස 04 වැනි දින ආරම්භ වී ඔක්තෝබර් මස 09 වැනි දින දිය කැපීමෙන් අවසන් කෙරේ.
2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස, බටහිර පෙදෙස වන පිරිත්වත්ත, ගල්වත්ත, මාළුකාර වත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහ ගෙදර වත්ත යන ප්‍රදේශ පෙරහැරට පැමිණෙන නැටුම් කණ්ඩායම්, වන්දනාකරුවන් ලැගුම් ගන්නා ප්‍රදේශ ලෙස නම් කෙරේ.
3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍ය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන, රථගෙය මැදිවත්ත හා ඒ අවට ප්‍රදේශය තුළ ආහාර පිසීම තහනම් කෙරේ.
4. උත්සව භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.
    * උත්සව කාලය තුළ වෙළඳාම් කිරීම සඳහා බදු දෙනු ලබන තාවකාලික කඩබිම් තුළ හා ඒ අවට නීත්‍යානුකූල නොවන භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම, විකිණීම සපුරා තහනම්ය.
    * ඩෙංගු මර්ධනය සඳහා සියලු තාවකාලික කඩ හිමියන් විසින් ඉවත දමනු ලබන සියලු අපද්‍රව්‍යය, ස්ථාන ගත කර ඇති බඳුන්වලට පමණක් බැහැර කළ යුතුය.
5. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශය තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටි පන්දම් හා බාර හාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම්ය.
6. විනෝද ක්‍රීඩා වෙනුවෙන් පැනවෙන නීති මෙම සියලුම කටයුතු සඳහා බස්නායක නිලමේ තුමාගෙන් අවසර ලබා ගත යුතු අතර ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලා සිටිනු ලබන බද්ද, ක්‍රීඩාව පවත්වා ගෙන යනු ලබන අය විසින් ගෙවිය යුතුය. එකී ක්‍රීඩා සඳහා ශබ්ද වාහිනී යන්ත්‍ර භාවිත කරන්නේනම් ගරු අධිකරණයේ අවසර ලබා ගත යුතු අතර මහ පෙරහැරේ වීදි බැසීමත් සමඟ සියලු කටයුතු තාවකාලිකව නතර කළ යුතුය. පෙරහැර අවසන් වූ පසු අවශ්‍ය නම් එම කටයුතු පැවැත්විය හැකිය.
7. ඉහත අංක 4.6 යන වගන්තිවලින් නියම කර ඇති භූමිය තුළ හැර වෙනත් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය.

8. දේවාල භූමියේ හා උඩමළුවේ බීමතින් හැසිරීම, දුම්වැටි භාවිතය සපුරා තහනම්ය.
9. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර සතුනට ආහාර සැපයීමට නොයා යුතුය.
10. උත්සව භූමියට වාහන ඇතුල් කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය ඇති වාහන වලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ග වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ.
    * කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අළුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හංදියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය ;
    * තොටපල්ල, පොකුණගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය ;
    * පිරිත්වත්ත, ගල්වත්ත, දේවාල ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
11. දේවාල භූමියට පැමිණෙන අවසරලත් වාහන ගාල්කර තැබීම සඳහා පහසුකම් පාසැල් ක්‍රීඩා පිටියේ සළසා ඇත.
12. දේවාලයේ දිග්ගෙය, මාලිගාවේ ඉහළ මාලය ඡායා රූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

08-962

---

**2014 බොල්තුඹේ සමන් දේවාලයේ ඇසළ පෙරහැර**

01. 2014 වර්ෂයේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2014 ජූලි මස 21 වැනි දින අළුයම සුබ මොහොතින් සිදු කරන ලදී.
    * අගෝස්තු මස 27 වැනි දින සිට සැප්තැම්බර් මස 06 වැනි දින දක්වා උඩ මළුවේ පෙරහැර ද,
    * සැප්තැම්බර් මස 07 වැනි දින සිට 13 වැනි දක්වා මහ පෙරහැර ද,
    * සැප්තැම්බර් මස 14 වැනි දින වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේදී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.
02. දේවාලයේ උතුරට පාර හා එම්. කේ. ලුවිස් සිංඤෝ, එම්. කේ. පොඩි මහත්තයා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට සිරිනිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම ද, දකුණට රන්බණ්ඩාර මහතාගේ ගල්පඩි වත්ත යන ඉඩම ද, බස්නාහිරට බී. එම්. විජේහාමි සහ නෝබට් චින්තාමනී යන අයගේ ඉඩම ද මායිම්ව පිහිටි භූමි භාගය වන්දනා කරුවන්ට ලැගුම් සඳහා ද පෙරහැර නැරඹීම සඳහා ද වෙන් කරමි.
03. විහාර මළුව, බෝ මළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.
04. උඩ මළුව තුළ, දඹු හැල තුළ, චෛත්‍ය මළුව තුළ, රථයේ මළුව හා විහාර මළුව තුළ සියලු වෙළඳාම් තහනම් කරමි.
05. පහල වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙල සිට සිංහාසන මන්දිරය දක්වා ගල් පඩිපෙල, නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා පහල වීදියේ දේවාලය දෙසට වන්නට රථගෙයි මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රථගෙයි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහල කොටස ද රථගෙයි ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව වෙළඳාම් සඳහා පෙරහැර ගමන් කිරීම සඳහා අවහිර නොවන පරිදි අවසර දෙමි.
06. ඉහත 04 හා 05 වලින් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.
07. ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුල් කිරීම තහනම්ය.
08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.
09. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.
10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම්ය.
11. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.
12. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත් කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතුය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

08-961

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී**

අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මතය

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ජූලි මස 04 වන දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, තෝඩුවාව, කුඩාමදුවැල්ල, අංක 41/1 දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය කැළුම් දිමන්ක ප්‍රනාන්දු (ජා.හැ.අ. 761770195v) සහ ජයසූරිය අලංකාරගේ ඇනිස්ටස් ලොයොලා පෙරේරා (ජා. හැ. අ. 516763086v) (මෙහි මින් මතු "බන්ධනදායීන්" වශනේ හඳුන්වනු ලබන) යන අය විසින් වාර ණය ආකාරයෙන් කලින් කලට බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායීන් විසින් එකී වාර ණය පහසුකම් මත යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් හැටපන්ලක්ෂ හැටදහසක (රු. 6,560,000) මුදල සහ ඒ මත පොළිය ගෙවීම සඳහා වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව් ශ්‍රීනා නිලුක්ෂි තිසේරා විසින් රුපියල් හැටපන්ලක්ෂ හැටදහසක (රු. 6,560,000) මුදලක් සඳහා සහතික කරන ලද අංක 1388 සහ 2013.08.01 දින දරන උකස් බැඳුම්කරය අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඇපයක් වශයෙන් යූනියන් බැංකුව වෙත උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව, ඉහත කී වාර ණය පහසුකම් නිසා 2014.03.18 වන දිනට මුළු හිඟ මුදල වන රුපියල් හැත්තෑඑක්ලක්ෂ විසිහයදහස් එකසිය අනූනවයකුත් ශත අනූ එකක (රු. 7,126,199.91) මුදල සහ 2014.03.19 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පොළිය ද, එකී බන්ධනදායීන් ගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය එකී බන්ධනදායීන් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් වාර ණය පහසුකම් මත 2014.03.18 වන දිනට රුපියල් හැත්තෑඑක්ලක්ෂ විසිහයදහස් එකසිය අනූනවයකුත් ශත අනූ එකක (රු. 7,126,199.91) මුදල සහ ඒ මත 2014.03.19 වන දින සිට පොළිය ද, තව ද, ඉහත කී අංක 1388 දරන බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 1388 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළයේ යටකලන් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 530A දරන මට්ටකාටුවැල්ල ග්‍රාම නිලධාරි වසම තුළ දකුණු තෝඩුවැව ගමේ පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වර්ණන් පෙරේරා විසින් මැන සාදන ලද අංක 6689 සහ 1991.12.09 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම් ඊසානට එකී පිඹුරේ කැබලි අංක 2 ද, ගිණිකොණට, මහවැව දක්වා දිවෙන පාර ද, නිරිතට බිබියන් ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද, වයඹට ඉග්නේෂස් ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිතුනක් (අ. 0, රූ. 02, පර්. 23) විශාල ඉඩම් කැබැල්ලය. මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K24/28A දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කැබැල්ල මෑත කාලයේ සිදු කළ මැනීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරළයේ යටකලන් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 530A දරන මට්ටකොටුවැල්ල ග්‍රාම නිලධාරි වසම් තුළ දකුණු තෝඩුවැව ගමේ පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3983 සහ 2010.03.19 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම් ඊසානට බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් මැන සාදන ලද අංක 6689 දරන පිඹුරේ කැබලි අංක 2 ද, ගිණිකොනට : මුහුදු වෙරළේ සිට මහවැව දක්වා දිවෙන පාර (කෙලින් පාර) ද, නිරිතට : බිබියන් ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද, වයඹට ඉග්නේෂස් ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිඑකයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 02, පර්. 21.40) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,
එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-1028

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.07.13 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනාව සම්මත කර ගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2012.09.14 දිනැති අංක 3029 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.05.26 දින තෙක් මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දෙකෝටි අසූ දෙලක්ෂ විසි අට දහස් හයසිය විස්සයි ශත තිස් දෙකක (රු. 28,228,620.32) මුදල සමග රුපියල් දෙකෝටි හැට හතර ලක්ෂ හැට දහස් අටසිය අසූ එකයි ශත අටක (රු. 26,460,881.08) මුදල මත වසරකට සියයට පහළොවක් (15%) බැගින් පොලියක් 2014.05.27 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කඩුවෙල, අවිස්සාවේල්ල පාරේ, අංක 511/5 හි ජයන්ත ඉංජිනියරින් ඇන්ඩ් ෆැබ්රිකේටර්ස් (තනි අයිතිකරු කඩුවෙල, හේවාගම, රණසිංහ මාවතේ අංක 330 හි පදිංචි වෛද්‍යරත්න ජීවන්දර මුදියන්සේලාගේ ජයන්ත ජීවන්දර) වෙතින් අයවිය යුතුව ඇත.
2. 2012.09.14 දිනැති 3029 අංක දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් දෙකෝටි අසූ දෙලක්ෂ විසි අට දහස් හයසිය විස්සයි ශත තිස් දෙකක (රු. 28,228,620.32) මුදල සමග 2014.05.27 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) සහ එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කඩුවෙල ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොතලාවල පිහිටි බෝගහඕවිට (පිඹුර ප්‍රකාර බෝගහවත්ත) නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද 2011 මැයි 3 වෙනි දිනැති අංක 4331 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පාර (කොළඹ සිට කඩුවෙලට) ද, නැගෙනෙහිරට : බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද අංක 1726 දරන පිඹුරෙහි ලොට් A1B1 ද, දකුණට : ප්‍රේමදාස පෙරේරාගේ ඉඩම ද, බස්නාහිරට : ඒ. ඒ. ඩබ්. ජයවර්ධනගේ ඉඩම ද මායිම්ව එකී අංක 4331 දරන පිඹුරට අනුව පර්චස් තිස් හතයි දශම එකයි පහක (අ.0, රූ. 0, පර්. 37.15) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙන් කොටසකි.

එකී කොතලාවල පිහිටි බෝගහඕවිට නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුලත්ව බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද 2003 මැයි මස 10 දිනැති අංක 1544 දරන පිඹුරෙහි ලොට් A1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A1 උතුරට : පාර (කොළඹ සිට කඩුවෙලට) ද නැගෙනහිරට : A2 සහ එස්. එම්. පියසීලිගේ ඉඩම ද, දකුණට : ප්‍රේමදාස පෙරේරාගේ ඉඩම ද, බස්නාහිරට : ඒ. ඒ. ඩබ්. ජයවර්ධන ගේ ඉඩම ද මායිම්ව එකී අංක 1544 දරන පිඹුරට අනුව පර්චස් විස්සයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.40) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1480/172 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඒ. ජී. අයි. පෙරේරා මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
කඩුවෙල.
08-981

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරැල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි.

වී2 ප්‍රොපටි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 ජූලි මස 31 වන දින පවත්වන ලද හැටන් නැෂණල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූද 2012 ජූලි 20 දින සහතික කළ අංක 1625 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වී2 ප්‍රොපටි මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූලක්ෂ අනූදෙදහස් තිස්තුනයි ශත විසිපහ (රු.9,092,033.25) ක මුදලක් 2014 මැයි 26 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 9,092,033.25 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 මැයි 27 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1625 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ වසම් අංක 01 රාජගිරියේ පිහිටි ඔබේසේකරපුර, නානායක්කාර මාවතේ පිහිටි ගෝතමී ගාඩ්න්ස් හි නානායක්කාර මාවතේ වරිපනම් අංක 181ඒ, 57 සහ 181ඒ 57 1/1 දරන තුඩුවේකුඹුර නමැති ඉඩමෙන් බෙදා වෙන් කොට ඇති බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාතන් විසින් 1999 දෙසැම්බර් මස 02 වැනි දින සාදන ලද අංක 4748/1998 දරන පිඹුරේ ලොට් 5ඒ වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාතන් විසින් 1998 ජුනි 20 දින මැන සාදන ලද අංක 4748/1998 දරන පිඹුරේ ලොට් 6 න් ද, නැගෙනහිරට : තුඩුවේකුඹුරෙන් ද, දකුණට: ලොට් 4 ඒ ද සහ බස්නාහිරට : ලොට් ආර් 2 (පාරක් සඳහා වෙන්කොට ඇති මීටර් 9 ක් පළල පාරෙන් ද) මායිම් වූ එකී අංක 4748/1998 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම හතයි පහ (අ. 0, රූ.0, පර්. 7.75) ක විශාලත්වයක් ඇති ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේ වන මෙය දෙල්කඳ- නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2966/228 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1625 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කරන ලද අංක 4748/1998 දරන පිඹුරේ දැක්වෙන ලොට් ආර් 1, ආර්. 2, ආර්. 3 මගින් ප්‍රවේශ අයිතිය සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,
කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-957/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ඈන් චාමේන් ස්ටේන්වෝල්.

2014 ජූලි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලදද්‍රා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූද 2008 ඔක්තෝබර් 03 දින සහතික කළ අංක 4531 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2010 මාර්තු 02 දින සහතික කළ අංක 3614 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඈන් චාමේන් ස්ටේන්වෝල් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැටපන්ලක්ෂ හැත්තෑහතරදහස් තුන්සිය අනූපහයි ශත විසිපහ (රු.6,574 395.25) ක මුදලක් 2014 අප්‍රේල් 24 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 6,574,395.25 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 අප්‍රේල් 25 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4531 හා 3614 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ පහළ කරගහමුණ හෙවත් නෙලිගම පිහිටි බෝගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එම්. කමල් පෙරේරා විසින් 2007 ජූලි 28 වන දින සාදන ලද 235/2007 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 2957 දරන පිඹුරේ ලොට් 1 ඒ ද නැගනෙහිරට : ඩී. ඩී. ඇලිස්නෝනාගේ ඉඩමෙන් ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 2936 දරන පිඹුරේ ලොට් 2 ඒ ද සහ බස්නාහිරට : අංක 2958 දරන පිඹුරේ ලොට් 1 බී ඉතිරි කොටසින් සහ මීටර් 3 ක් පළල පාරෙන්ද මායිම් වූ එකී අංක 235/2007 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වයෙන් යුක්තව වන මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු සී 877/202 යටතේ ලියාපදිංචි වී ඇත.

එකී අංක 4531 සහ 3614 දරන උකස්කරවල උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති වෙන්කොට ඇති පාර මතින් මාර්ග අයිතිය ද සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-957/2

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - හෙට්ටි වීදිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

මොහිදීන් බාවා අතම් ලෙබ්බේ.

2014 ජූලි මස 31 දින පවත්වනල ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූද 2013 අප්‍රේල් 16 දින සහතික කළ අංක 1845 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහිදීන් බාවා අතම් ලෙබ්බේ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි විසිහයලක්ෂ තුන්දහස් දෙසීයඅනූවයි ශත තිහ (රු.12,603,290.30) ක මුදලක් 2014 අප්‍රේල් 30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 12,603,290.30 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 මැයි 01 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1845 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කිස්ස ග්‍රාම නිලධාරි වසම් අංක 541 දරන ගල්කිස්ස පිහිටි අවුබර්න්සයිඩ් හි වරිපනම් අංක 14/1, දරන නුගගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ටී. මුත්තුනායකපිල්ලේයි විසින් 1946 මාර්තු මස 12 වැනි දින සාදන ලද පීඑස් අංක 2 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් සී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් බී ද, නැගෙනහිරටː පැසේජයෙන් ද, දකුණට : ලොට් ඩී සහ ඊ ද සහ බස්නාහිරට : නැසීගිය එම්. එක්ස්. රෝච්ගේ උරුමක්කරුවන් හිමිකම් කියන දේපළෙන්ද මායිම් වූ එකී පී එස් අංක 2 දරන පිඹුර ප්‍රකාරව අනුව පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේ වන මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2792/102 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතකදී කළ මැනීමකින් පසු මෙසේ විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කිස්ස ග්‍රාම නිළධාරි වසම් අංක 541 දරන ගල්කිස්ස පිහිටි අවුබර්න්සයිඩ් හි වරිපනම් අංක 14/1, දරන නුගගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් 2004 මාර්තු මස 25 වැනි දින සාදන ලද අංක 1040 දරන පිඹුරෙන් බෙදා වෙන් කල ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : අවුබර්න් සයිඩ් හි වරිපනම් අංක 14/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරටː පැසේජයෙන් ද, දකුණට : අවුබර්න් සයිඩ් හි වරිපනම් අංක 14, දරන පරිශ්‍රය ද සහ බස්නාහිරට : කාණුවෙන් (සිමෙන්ති) ද මායිම් වූ එකී අංක 1040 දරන පිඹුර ප්‍රකාරව අනුව පර්චස් අටයි දශම එකයි එක (අ. 0, රූ. 0, පර්. 8.11) ක විශාලත්වයෙන් වූ ඉඩම සහ ගොඩනැගිලි සමඟ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

08-957/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී.එල්.සි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

බී. ජී. එස්. කුමාර.

ගිණුම් අංක 0048 5000 0242.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 මාර්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පී.එල්.සී. නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2010 ඔක්තෝබර් 27 දාතම හා අංක 5355 දරන සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2011 සැප්තැම්බර් 09 දාතම හා අංක 3102 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුලුගහ ගෙදර ශාන්ත කුමාර යන අය බන්ධනාදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක 5355 සහ 3102 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි පන් ලක්ෂ හැට අට දහස් එකසිය අනූ එකයි ශත දහ තුනක (රු. 20,568,191.13) මුදලක් 2014 පෙබරවාරි 24 වැනි දිනට එකී පිහිටි සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි පන් ලක්ෂ හැට අට දහස් එකසිය අනූ එකයි ශත දහ තුනක (රු. 20,568,191.13) මුදල ද, 2014 පෙබරවාරි 25 දින සිට අංක 5355 සහ 3102 දරන එකී බැඳුම්කර මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි විසිහය ලක්ෂ දෙදහස් හාරසිය දහසයයි ශත තිහක (රු. 12,602,416.30) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) රුපියල් හැට ලක්ෂ අසූ හතර දහස් දෙසීය අසූ අටයි ශත අනූ දෙකක (රු. 60,84,288.92) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) හා තවත් රුපියල් හත් ලක්ෂ අසූ එක් දහසක (රු. 781,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 5355 සහ 3102 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පී.එල්.සී. වෙත උකස් කොට ඇති මෙහි උපලේඛණයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ ආනන්ද මාවතේ, පිටකෝට්ටේ පිහිටි බැද්දගාන, ආනන්ද මාවත, වරිපනම් අංක 4/5 "ගොරකාගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එන්. ඒ. අල්විස් යන අය විසින් සාදන ලද 2008 අගෝස්තු 10 දාතම හා අංක 3238 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 05 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායම්, උතුරට : ලොට් 6, නැගෙනහිරට : ආනන්ද මාවත, දකුණට : අංක 774 දරන පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : කලින් ආරොන් පෙරේරාගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම දෙකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 18.24) විශාල ඉඩම කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3238 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 19/91 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පා ගමන් සහ වාහන ගමනාගමනය යන දෙකම සඳහා දමා ඇති හෝ දමා නොමැති මාර්ග සඳහා අයිතිය සහ ඒවා මතින් යටින් ඉහළින් සහ දිගේ විදුලිය සහ සන්නිවේදන සංදාම, ජලාපවහන මලාපවහන සහ ජලනල සහ අනෙකුත් ප්‍රධාන වයර් සහ අනෙකුත් සෑදුම් නිර්මාණ සහ පහසුකම් සඳහා ඇති අයිතියද සමගය.

එකී පිටකෝට්ටේ පිහිටි "ගොරකාගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජෙගතීසන් යන අය විසින් සාදන ලද 1960 දෙසැම්බර් 06 දාතම හා අංක 774 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 21 (අඩි 30 පළල මාර්ග වෙන් කිරීමක් වන) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 12 සහ ලොට් 14 සිට 20, දකුණට : දියපාර සහ බස්නාහිරට : ලොට් 1 සිට 9 සහ ලොට් 11 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් පහළොවයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 15.20) විශාල ඉඩම් කොටස සමග එකී අංක 774 දරන පිඹුරට අනුව වෙළුව/පත්ඉරුව M 2297/114 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08 - 1047/1

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk